
# මංගලසිරිපුර නවෝදය

හොරණ මංගලසිරිපුර ප්‍රදේශයට සුපුරුදු පරිදි හිරු උදාවන්නේ "නවෝදා ෆුඩ් ප්‍රඩක්ට්ස්" ආයතනයට තවත් සාර්ථක දිනයක් උදා කරමිනි. ඔහු නමින් සමන් ෂෙල්ටන් කුමාර ය. හොරණ මංගලසිරිපුර ප්‍රදේශයේ ජනතාව මෙම තැනැත්තා වඩා හොඳින් දැන හඳුනන්නේ "නවෝදා ෆුඩ් ප්‍රඩක්ට්ස්" යන වෙළෙඳ නාමය නිසා ය. "සිත ඇත්නම් පත කුඩා ද?" යන කියමන සනාථ කරමින් ව්‍යාපාරික ලෝකයේ සාර්ථක පියවරක් තබා ඇති තවත් එක් ව්‍යාපාරිකයෙක් වශයෙන් ඔහුව හඳුන්වා දිය හැකි ය. ජීවිතයේ ළඟා කර ගැනීමට අපහසු යැයි හැඟෙන බොහෝ ඉලක්ක සමන් මහතා තම උත්සාහය හා කැපවීම පදනම්ව ලබාගත හැකි බව ඔප්පු කොට හමාර ය. හුදෙක් ව්‍යාපාරිකයෙකු නොවන මෙම පුද්ගලයා සාර්ථක එමෙන්ම ධෛර්යවන්ත සුන්දර මිනිසෙකි. සාර්ථකත්වයේ මං පෙත් විවර කර ගැනීම සඳහා ඔහු විසින් කැප කළ දෑ බොහෝ ය. ඒ සිදුකළා වූ අනන්ත කැප කිරීම්වල සාර්ථක ප්‍රතිඵල වර්තමානයේ ඔහු භුක්ති විඳින්නේ ඉමහත් සතුටකිනි.


සමන් මහතා

පාසල් අවධියේ සිටම ඔහු තුළ තිබූ සහජ දක්ෂතාවය මත අ.පො.ස. (උ.පෙ) දක්වා අධ්‍යාපන කටයුතු හැදෑරී ය. ඉන් අනතුරුව සමන් මහතා යොමු වන්නේ පෞද්ගලික ආයතනයක රැකියාවක් සඳහා ය. සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් වූ මෙහි අලෙවි නිලධාරියෙකු ලෙස වසර 12 ක පමණ කාලයක් සේවා නියුක්තව සිටියේ ය. සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින වෙළෙඳපොල ඉල්ලුම පිළිබඳව දිගින් දිගටම සිතා බැලූ සමන් මහතාගේ සිතට පහළ වන්නේ අපූරු ව්‍යාපාරික සිතිවිල්ලකි. ඒ තමාගේම කියා කුඩාවට සහල් පිටි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ය. රැකියාවට ආයුබෝවන් කියූ මොහු තම නිවසේ සිට සහල් පිටි නිෂ්පාදනයට අවශ්‍ය සැලසුම් සකස් කෙරෙන්නේ වර්ෂ 2005 වකවානුවේදී ය. රැකියාව හරහා ලද අත්දැකීම් සම්භාරයක් සමඟින් ඔහු පිවිසෙන්නේ තෙත පිටි නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ය. මෙතෙක් ඉතුරු කර ගත් සුළු මුදලක් යොදා ඊට අවශ්‍ය යන්ත්‍රයක් මිලට ගත් ඔහු දිනකට සහල් පිටි කිලෝ 12 ක් පමණ නිෂ්පාදනයකට මුල පිරී ය. ඒ වකවානුව වනවිට තම යතුරුපැදිය ආශ්‍රයෙන් තමා දන්නා, එමෙන්ම, හඳුනාගත් වෙළෙඳසැල් කිහිපයකට පමණක් බෙදා හැරීම සිදු කළේ ය. සහල් මිල දී ගැනීම ද තමාගේම විශ්වාසවන්ත මිතුරෙකුගේ මාර්ගයෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ගත්තේ ය.

කාලයත් සමඟම දෛනික පිටි ඉල්ලුම ක්‍රමයෙන් ඉහළ යන්නට විය. එය දිනකට කිලෝග්‍රෑම් 200ක මට්ටමකට පත් වන්නේ 2006 වර්ෂයේ අගභාගය වනවිට ය. දෛනික ඉල්ලුම සපුරාලීමේ පහසුව සඳහා ත්‍රීරෝද රථයක් මිලට ගැනීම සිදු කරන්නේ මේ අවධියේ ය. මෙතෙක් පැවති තම ප්‍රදේශයට පමණක් සීමා වූ බෙදා හැරීමේ කටයුතු තරමක් පුළුල් කරන්නට අදහසක් පහළ වන්නේ ත්‍රී රෝද රථය මිලට ගැනීමත් සමඟ ය. මේ කාල වකවානුව වනවිට සේවක අවශ්‍යතාවය ඔහු හට තදින්ම දැනෙන්නට විය. ඒ සඳහා විශ්වාසවන්ත පුද්ගලයන් දෙදෙනෙකු සමඟින් තම ඉදිරි ගමන යෑමට ඔහු තීරණය කළේ ය. දිනෙන් දින සාර්ථකත්වය කරා ඇදී යන තම ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමේ අටියෙන් කුඩා ප්‍රමාණයේ ලොරි රථයක් ද මිලට ගැනීමට ඔහුට හැකි විය. ඒ වර්ෂ 2009දී ය. ඒ වනවිට සමන් මහතාගේ දෛනික පිටි ඉල්ලුම කිලෝග්‍රෑම් 600 ක් තරම් ඉහළ මට්ටමක පැවතිනි. රාත්‍රිය පහන් වනතුරු නිදිවර්ජිතව තම ව්‍යාපාරයේ දියුණුව සඳහා සමන් මහතා කළ කැප කිරීමේ තරම

ඔහුගේ දයාබර බිරිඳ විසින් පවසන්නේ මහත් වූ ආඩම්බරයෙනි.

දියුණුවේ මංපෙත් විවර කර ගැනීමේ පැවුල ඥානයක් සමන් මහතා සතුව තිබීම දියුණුවේ රහස විය හැකි ය. විශ්වාසවන්ත සේවක මණ්ඩලයකින් හෙබි "නවෝදා ෆුඩ් ප්‍රඩක්ට්ස්" ආයතනය මේ වනවිට ඉදිරි පියවරයන් කිහිපයක් තබා තිබීම තවත් සුවිශේෂී කාරණයකි. මේ වනවිටත් පිඹුරුපත් සකසමින් සිටින්නේ ඉඳි ආප්ප පිටි නිෂ්පාදනය ද ආරම්භ කිරීමට ය. එය සමන් මහතාගේ ඉදිරි ගමනේ තවත් එක් සන්ධිස්ථානයක් වන්නට බොහෝ ඉඩකඩ පවතී. මෙතුවක් ආ ගමන

**සුළු පරිමාණ සහල්පිටි නිෂ්පාදන කර්මාන්තයක් ඇරඹීම සඳහා මූලික වියදම්**

| විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| FFC- 45 ඩිස්ක් මිල් යන්ත්‍රය | 40,000.00 |
| මෝටරය (අශ්වබල 15) | 50,000.00 |
| තරාදිය | 25,000.00 |
| ගොඩනැගිල්ල (වර්ග අඩි 750) | 150,000.00 |
| විදුලිබලය සඳහා | 100,000.00 |
| බෙදා හැරීමේ මෝටර් රථ (1) | 765,000.00 |
| බෙදාහැරීමේ මෝටර් රථ (2) | 840,000.00 |
| මුළු පිරිවැය | 1,970,000.00 |

*මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය – 2010*

පුරා පෙනෙන්නට ඇත්තේ සමන් මහතාගේ ධෛර්යය, කැපවීම හා ආත්ම විශ්වාසය යි. එමෙන්ම, නව ව්‍යාවසායකයින් සඳහා අවශ්‍ය අත්දැකීම් ඕනෑම විටක තමා හා බෙදා හදා ගැනීමට ඔහු නිරතුරුවම අපේක්ෂාවෙන් සිටින බව තවදුරටත් පවසයි.

ඒ අනුව, බෙදා හැරීමේ මෝටර් රථයක් සහිතව සුළු පරිමාණ තෙත පිටි කර්මාන්තයක් ඇරඹීම සඳහා රුපියල් මිලියනයකට වැඩි මූලික වියදමක් දැරීමට අවශ්‍ය වන බව ද, තෙත පිටි කිලෝග්‍රෑම් 1ක් සඳහා නිෂ්පාදන වියදම වශයෙන් රු.2.44 කට ආසන්න පිරිවැයක් දැරීමට සිදුවන බව ද සමන් මහතා පාදක කර ගනිමින් සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී පෙනී ගිය කරුණකි. දෛනික තෙත පිටි ඉල්ලුම සලකා බැලීමේ දී වර්තමානයේ වඩාත් ලාභ ගෙන දෙන්නා වූ ව්‍යාපාරයක් වශයෙන් තෙත පිටි නිෂ්පාදන කර්මාන්තය හැඳින්වීමට පුළුවන.

සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින වර්තමාන ප්‍රවණතාව සමග තමාහට ව්‍යාපාරික ලෝකයේ දිගු ගමනක් යෑමට හැකි බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ය.

**කේ.වයි. තරිඳු නයනජිත්**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

## ගොවි ජනතා

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර ප්‍රකාශනයක් වන ගොවි ජනතා සඟරාවට ඉහළ පාඨක ප්‍රතිචාරයක් ලැබෙමින් පවතී. එකී ප්‍රතිචාර අතර ගොවි ජනතා සඟරාවට ලිපි සැපයීමට කැමැත්ත පල කරමින් සිදු කෙරෙන විමසීම් ද වේ. එබැවින්, මේ සඳහා පාඨක ඔබගේ ඉල්ලීම අනුව ඔබට ද දායකත්වය සැපයිය හැකි අතර සමාජ - ආර්ථික පර්යේෂණ අලලා ලියැවෙන ලිපි පහත සඳහන් ලිපිනයට යොමු කළ හැකි ය.

සංස්කාරක
**ගොවි ජනතා**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන
114, විජේරාම මාවත, කොළඹ - 07.